කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

මධ්‍ය වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

කාලය පැය 02 යි

පළමු වන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(1) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමිතු හා කමිතු විසින් විවිධ උත්සව සඳහා මල් විකිණීමේ හා මල් සැරසිලි කිරීම ආශ්‍රිත ව්‍යාපාරයක් වසර තුනක සැලසුම්ගත ලිඛිත ගිවිසුමක් යටතේ රු.400 000 ක් වටිනා සමිතු සතු ගොඩනැගිල්ලක 2017.01.01 දින ආරම්භ කරන ලදී.ඔවුන් ප්‍රාග්ධනය ලෙස රු. 100 000 බැගින් යෙදූ අතර එදිනම මහජන බැංකුවෙන් 15% වාර්ෂික පොලියට රු.100 000 ක ණය මුදලක් ද ව්‍යාපාරයේ ප්‍රවාහන කටයුතු සඳහා රු. 25 000 ක මාසික කුලී පදනම යටතේ කුඩා ලොරි රථයක් ද ලබාගැනීමට කටයුතු කළේය. ලොරි රථයේ ජනවාරි මාසයට අදාළ කුලිය එදිනම ගෙවන ලදි. මෙම ව්‍යාපාරයේ පාරිභෝගික ඇණවුම් ලබාගැනීම සඳහා "නිර්මාණී ෆ්ලෝරා" නමින් වෙබ් අඩවියක් ද ආරම්භකර ඇත. වසර තුනකින් අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීමෙන් පසුව මෙම ව්‍යාපාරය සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට ඔවුන් අපේක්ෂා කරයි.

2017 ජනවාරි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

	රු.
ලී රාක්ක හා මල් බහාලුම් මිලට ගැනීම	50 000
මල් අත්පිට මුදලට ගැනීම	80 000
ණයට මල් ගැනීම	20 000
රියදුරු වැටුප් ගෙවීම	25 000
මල් මුදලට විකිණීමෙන් ලද ආදායම	60 000
මල් සැරසිලිවලින් ලද ආදායම	75 000
සැරසිලි උපකරණ ණයට ගැනීම	40 000
විදුලි ගාස්තු ගෙවීම	2 000
විවිධ වියදම් ගෙවීම	15 000
ණයට මල් විකිණීමෙන් ලද ආදායම	18 000

(මිලදී ගත් සියලු මල් විකුණා ඇති අතර 2017 පෙබරවාරි මස සිට ව්‍යාපාරයේ ගනුදෙනු ජංගම ගිණුමක් මගින් සිදු කිරීමට තීරණය කරන ලදි.)

I. (අ) අරමුණු අනුව වර්ග කරන්නේ නම් මෙම ව්‍යාපාරය අයත් වන්නේ කුමන සංවිධාන වර්ගයටද?
(ආ) අයිතිය අනුව වර්ග කරන්නේ නම් මෙම ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ලකුණු 02)

II. (අ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය අයත් ව්‍යාපාර වර්ගය කුමක්ද?
(ආ) පහත සඳහන් නිෂ්පාදන සාධක සඳහා මෙම සිද්ධිය ඇසුරෙන් නිදසුන බැගින් දක්වන්න.
1. ශ්‍රමය 2. ප්‍රාග්ධනය (ලකුණු 02)

III. (අ) හවුල් ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාමෙන් මෙම ව්‍යාපාරයට ඇතිවන වාසි දෙකක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරය සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් බවට පත්කර ගැනීමෙන් ලබාගත හැකි වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

IV. (අ) මෙම ව්‍යාපාරයට සම්බන්ධ උපකාරක සේවා දෙකක් ලියන්න.
(ආ) බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීමෙන් මෙම ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

V. 2017.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය ලියන්න. (ලකුණු 02)

VI. ඉහත ගනුදෙනුවලට අදාළව මෙම ව්‍යාපාරය විසින් පවත්වාගෙන යා යුතු මූලික පොත් 04 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

VII. (අ) 2017 ජනවාරි මාසය සඳහා ගෙවිය යුතු බැංකු ණය පොලිය කොපමණද?
(ආ) එම අගය ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 02)

VIII. 2017.01.31 දිනට මෙම ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද? (ලකුණු 02)

IX. 2017.01.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම්වල අගයයන් ගණනය කරන්න. (ලකුණු 02)

X. 2017 ජනවාරි මාසය සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණ ද? (ලකුණු 02)

මුළු ලකුණු 20)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. I. ,,(අ) භාණ්ඩ හුවමාරු ක්‍රමය (Bartar System) යනු කුමක් ද?
(ආ) ව්‍යාපාරයකින් ප්‍රතිලාභ බලාපොරොත්තු වන පාර්ශ්ව 02 ක් ලියන්න. (ලකුණු 02)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍යය ද යන්න දක්වන්න.
(අ) ව්‍යාපාරයක කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස ගනුදෙනුකරුවන් වේ.
(ආ) ව්‍යාපාරයක් විසින් පාරිභෝගිකයින් වෙත ලබා දෙන ක්‍රියාවක් සේවාවක් ලෙස හඳුන්වයි.
(ඉ) ව්‍යාපාරිකයින් නව්‍යතා සම්පාදනය කරයි.
(ඊ) ව්‍යාපාරික කටයුතු ඉටු කිරීමට ශ්‍රමය සපයන පුද්ගලයෝ සේවකයෝ වෙති. (ලකුණු 02)

III. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පිළිබඳ පාසල් ගුරුවරයෙකු වූ ගජනායක අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ආකාරය රූප සටහනක් මඟින් ඇඳ දක්වන ලෙස පන්තියේ සිසුවියක වූ මන්තිලාට පැවසූ අතර , ඇය විසින් එය නිවැරදිව ඉදිරිපත් කිරීමට සමත් විය.
(අ) ඉහත සිද්ධියට අනුව මන්තිලා විසින් ඉදිරිපත් කළ රූප සටහන ඇඳ දක්වන්න.
(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02)

IV. පුද්ගලික විදුලි කාර්මික ශිල්පියෙකු වූ සමීර සෙලින්කෝ ඉන්ෂුවරන්ස් ආයතනයෙන් රු.100 000 ක ජීවිත රක්ෂණ ඔප්පුවක් 2018.03.10 දින ලබාගත් අතර 2018.03.15 දින සේවය කරමින් සිටිය දී ඔහු හදිසි අනතුරකට භාජනය විය.
(අ) මෙම රක්ෂණ ඔප්පුව යටතේ අදාළ පාර්ශවයන්ට වන්දි මුදල් ලබාගත හැකිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.
(ආ) ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ ලබාගත හැකි අතුරු ආවරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

මුළු ලකුණු 08)

03. I. (අ) සිල්ලර වෙළෙඳාම යනු කුමක් ද?
(ආ) සුපිරි වෙළෙඳසැල් වර්තමානයේ ඉතා ජනප්‍රිය සිල්ලර වෙළෙඳසැල් විශේෂයක්වීමට හේතු 02 ක් ලියන්න. (ලකුණු 02)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍යය ද යන්න දක්වන්න.
(අ) ක්‍රීඩා උත්සවයක් සඳහා බනිස් 200 ක් බේකරියකින් මිලදී ගැනීම තොග වෙළෙඳාමකි.
(ආ) ස්ථාවර තැන්පතුවක් කල්පිරීමට පෙර මුදල් ලබා ගත නොහැකිය.
(ඉ) පුද්ගලයෙකුට තමාගේම දරුවෙකු රක්ෂණය කිරීමට හිමිකමක් නැත.
(ඊ) ජංගම ගිණුම් හිමියෙකුට ATM කාඩ් පතක් ලබා ගත නොහැකිය. (ලකුණු 02)

III. හදිසි අනතුරකට මුහුණ දුන් පාසල් සිසුවෙකුට, සුරක්ෂා රක්ෂණ ආවරණය යටතේ රු.50000 ක වන්දි මුදලක් ගෙවන බවට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය ඊමේල් පණිවිඩයක් මඟින් දන්වා ඇත.
මෙම සිද්ධියට අදාළ සන්නිවේදන ක්‍රියාවලියේ ,

1. යවන්නා
2. පණිවිඩය
3. මාධ්‍යය
4. ලබන්නා වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

IV."ශ්‍රී ලංකාව තුළ අධිවේගී මාර්ග සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහල යමින් පවතී "
(අ) ඉහත ප්‍රකාශයට අනුව අධිවේගී මාර්ග ඉදි කිරීමට පක්ෂව කරුණු 02 ක් හා විපක්ෂව කරුණු 02 ක් බැගින් ලියන්න.
(ආ) ශ්‍රී ලංකාවේ පහත සඳහන් මගී ප්‍රවාහන සේවා සපයන රාජ්‍ය ආයතනය බැගින් ලියන්න.

1. දුම්රිය ප්‍රවාහනය
2. මහා මාර්ග ප්‍රවාහනය (ලකුණු 02)

(මුළු ලකුණු 08)

04. I. ශ්‍රී ලංකාවේ පොදු අංශයේ බොහෝ ව්‍යාපාරවල කාර්යක්ෂමතාව හා සඵලදායීත්වය අඩු මට්ටමක පවතින බවට ජනතාව තුළ මතයක් පවතී.
(අ) කාර්යක්ෂමතාව හා සඵලදායිත්වය යන්න වෙන වෙනම පැහැදිලි කරන්න.
(ආ) ගංවතුරෙන් හා නායයාම්වලින් ආපදාවලට පත්වූ ප්‍රදේශයක ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් සිදු කළ කාර්යයන් දෙකක් පහත දැක්වේ.
1. හදිසි ආපදාවන්ට පත් වූ ජනතාවට සහන සැලසීම සඳහා කමිටුවක් පත් කිරීම
2. එම කමිටුවට අදාළ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
ඉහත 1 හා 2 කාර්යයන්ට අදාළ කළමනාකරණ කාර්යයන් වෙන වෙනම ලියා දක්වන්න.(ලකුණු 02)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) රජයේ අයවැය ප්‍රතිපත්තිය ආර්ථික පරිසරයේ උප සාධකයකි.
(ආ) කළමනාකරුවන්, කළ යුතු කාර්යයන් පිළිබඳව සේවකයින්ට මග පෙන්වයි.
(ඉ) වෙළෙඳපලක් යනු ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් හමු වන ස්ථානයකි.
(ඊ) ආකර්ශනීය ඇසුරුමක් නිහඬ විකුණුම්කරුවෙකු ලෙස ක්‍රියා කරයි.

III. සතිපතා පුවත්පතක ව්‍යාපාරික පුවත් පිටුවේ පළ වූ සිරස්තලයක් පහත දැක්වේ.
'වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ සෘජු විකුණුම් ක්‍රමය ජනප්‍රිය වෙමින් පවතී.'
(අ) මෙම ක්‍රමය තුළින් පාරිභෝගිකයින්ට ලැබෙන වාසි 02 ක් දක්වන්න.
(ආ) කිසියම් නිෂ්පාදිතයක මිල තීරණය කිරීමේදී සලකා බලන සාධක කවරේද? (ලකුණු 02)

IV. කළුතර වෙළඳ හා කර්මාන්ත සංගමයේ මාසික රැස්වීම සඳහා පැමිණි මහජන බැංකුවේ නිලධාරීන් පිරිසක් විසින් එම රැස්වීමට සහභාගී වූ ව්‍යාපාරික ප්‍රජාවට පීපල්ස් වීසා ණය කාඩ්පත හඳුන්වා දීමට වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
(අ) මෙම හමුවේ දී බැංකු නිලධාරීන් විසින් ණය කාඩ්පත් යොදා ගැනීමෙන් පොදුවේ ලබා ගත හැකි වාසි පිළිබඳව ප්‍රකාශ කරන්නට ඇතැයි සිතිය හැකි කරුණු 04 ක් ලියන්න.
(ආ) මෙම සිද්ධිය තුළින් මතුවන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් සඳහන් කර ඒ සඳහා සිද්ධිය තුළින්ම නිදසුනක් ලියා දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

II කොටස - ගිණුම්කරණය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

05. I. (අ) මූල්‍ය ගිණුම්කරණය යනු කුමක්ද?
(ආ) මූලාශ්‍ර ලේඛනවල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

II. පහත සඳහන් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛනය සහ මූලික සටහන් පොත ලියන්න.

	ගනුදෙනුව	මූලාශ්‍ර ලේඛනය	මූලික පොත
01	අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.4000 ක භාණ්ඩ තොගයක් ව්‍යාපාරයෙන් ලබා ගැනීම		
02	ව්‍යාපාරයේ ණයහිමියෙකු වූ චාන්දනීට රු.2000 ක් මුදලින් ගෙවීම		

(ලකුණු 02)

III. ජයමල් විසින් 2017.02.01 දින ආරම්භ කරන ලද ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයේ පළමු මාසයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

01.රු.100000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම

02.ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 60000 ක ලී බඩු හා උපකරණ මිලදී ගැනීම

03.කඩ කුලී ලෙස රු. 5000 ක් ගෙවීම

04.ජයමල්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.10000 ක් ව්‍යාපාරයෙන් ලබා ගැනීම

05.රු.50000 ක බැංකු ණයක් ලබා ගැනීම

06.සේවා සැපයීමෙන් රු.30000 ක ආදායමක් ලැබීම

07.විදුලිය ගාස්තු ලෙස රු.4000 ක් ගෙවීම

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම ලියා දැක්වීම. පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුව නිදසුනක් ලෙස පහත දක්වා ඇත.

ගනු දෙනු අංකය	වත්කම්	=	හිමිකම	+	වගකීම්
1	+ 100000 මුදල්	=	+ 100000 ප්‍රාග්ධනය		
2					
3					
4					
5					
6					
7					

(ආ) මෙම ව්‍යාපාරය 2017 පෙබරවාරි මාසය තුළ දී ලැබූ ලාභය කොපමණද? (ලකුණු 04)

IV. සමනලීගේ ව්‍යාපාරයේ 2017.03.01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

- ණය ගැති - රු.18 000
- ණය හිමි - රු.14 000
- බැංකු - රු.26 000

2017 මාර්තු මස පළමු සතිය තුළ සිදු වූ බැංකු ගනුදෙනු මෙසේය.

2017.03.02 - ණයගැතියෙකුගෙන් ලැබී තිබූ අංක 810 දරණ රු.8 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම
2017.03.03 - ණයහිමියෙකුට අංක 402 දරණ රු.10 000 ක චෙක්පත නිකුත් කිරීම
2017.03.04 - අත්පිට විකුණුම්වලින් ලැබූ අංක 1005 දරණ රු.12 000 ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කිරීම
2017.03.05 - ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා අංක 403 දරණ චෙක්පතින් රු.5 000 ක් බැංකුවෙන් ලබා ගැනීම
2017.03.06 -ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ අංක 810 දරණ රු.8 000 ක චෙක්පත අගරු වීම
2017.03.07 - ණය හිමියෙකුට නිකුත් කළ අංක 402 දරණ රු.10 000 ක චෙක් පත අගරු වීම
අවශ්‍ය වන්නේ :

(අ) 2017 මාර්තු මස පළමු සතිය සඳහා ව්‍යාපාරයේ බැංකු ගිණුම පිළියෙල කිරීම (තුලනය කිරීම අවශ්‍ය නැත)

(ආ) 2017 මාර්තු මස 07 දිනට ණයගැතියන්ගේ හා ණය හිමියන්ගේ අගයයන් වෙන වෙනම ලියා දැක්වීම.

(ලකුණු 04)
(මුළු ලකුණු 12)

06. I. (අ) මුදල් වට්ටම් යනු කුමක්ද?
(ආ) ස්ථාවර තැන්තුවක රු.200000 ක මුදලක් ආයෝජනය කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 02)

II. ජයලත් විසින් ඔහුගේ ව්‍යාපාරයේ 2017 මැයි මාසයට අදාළ පහත සඳහන් තොරතුරු ඔබට ඉදිරිපත් කර ඇත.

- 2017.05.31 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය - රු.12000
- තැන්පත් කළ නමුත් මැයි මාසය තුළ නිශ්කාෂණය නොවූ චෙක්පත්වල වටිනාකම - රු.9000
- නිකුත් කළ නමුත් මැයි මාසය තුළ බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම - රු.15000

අවශ්‍ය වන්නේ :

2017.05.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම (ලකුණු 02)

III. ජයරුවන් ගාමන්ට්ස් හි ගිණුම් ලිපිකරු විසින් 2017 ඔක්තෝම්බර් මාසයට අදාළ පහත සඳහන් මූලාශ්‍ර ලේඛන ඔබට ඉදිරිපත්කර ඇත.

ජය රුවන් ගාමන්ට්ස්
අංක 151, මතුගම පාර,
කළුතර.

සඳමිලා පැෂන් හවුස්,
අංක 232, හොරණ පාර,
පානදුර .

අංක 106

දිනය 2017.10.05

ඉන්වොයිසිය

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල රු.	වටිනාකම රු.
01	ළමා කමිස	50	200	10000
02	ළමා කමිස	50	250	12500
[redacted]				22500
	අඩුකළා වට්ටම 10%			2250
				20250

(සියළුම චෙක්පත් ජයරුවන් ගාමන්ට්ස් නමට ලියා රේඛනය කරන්න)
කොන්දේසි - 5/30/ශුද්ධ 45

අමරසිරි පෙරේරා
.....
කළමනාකරු

ජය රුවන් ගාමන්ට්ස්,
අංක 151, මතුගම පාර,
කළුතර

අජ්සරා ටෙක්සටයිල්ස්,
අංක 80, ගාලු පාර,
අළුත්ගම.

අංකය 107
දිනය 2017.10.18

ඉන්වොයිසිය

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිළ රු.	වටිනාකම රු.
01	අත් දිග කමිස	60	750	45000
02	අත්කොට කමිස	50	600	30000
[redacted]				
				75000

(සියළුම චෙක්පත් ජයරුවන් ගාමන්ට්ස් නමට ලියා රේඛනය කරන්න)

කොන්දේසි- 5/45/ශුද්ධ 60

අමරසිරි පෙරේරා
.....
කළමනාකරු

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත මූලාශ්‍ර ලේඛන ඇසුරෙන් ජයරුවන් ගාමන්ට්ස් හි අදාළ මූලික පොත පිළියෙල කිරීම.

(ආ) එම මූලික පොතේ සටහන් කළ ගනුදෙනු අදාළ ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම. (ලකුණු 04)

IV. ජයනන්දගේ ව්‍යාපාරයේ 2017 නොවැම්බර් මස 30 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවීය. එහි වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කළ අතර පසුව ගිණුම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් වැරදි අනාවරණය කර ගන්නා ලදී.

- දුන් වට්ටම් රු.2000 ලද වට්ටම් ගිණුමේ හර පැත්තේ සටහන් කිරීම.
- ණය ගැතියෙකු වූ චම්පා විසින් එවන ලද රු 4800 ක චෙක්පත ඇයගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් කර තිබීම.
- රු.3000 ක රක්ෂණ ගාස්තු ගෙවීම අදාළ ගිණුම්වල රු.300 ක් ලෙස සටහන් කර තිබීම.
- ගෙවූ පොලී ගිණුමේ ශේෂය වූ රු. 7500 ශේෂ පිරික්සුමට පිටපත් කර නොතිබීම.

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත සඳහන් වැරදිවලින් ශේෂ පිරික්සුමට බලපෑමක් ඇති නොවූ වැරදි නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් දැක්වීම.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කර ශේෂ පිරික්සුමේ එකතුව අතර තිබූ වෙනස දැක්වීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

07. I. (අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අරමුණ කුමක්ද?

(ආ) ජංගම නොවන වත්කම් ක්ෂය වීමට හේතු වන ආර්ථික සාධකයක් හා භෞතික සාධකයක් ලියා දක්වන්න.

(ලකුණු 02)

II. නාමල් විසින් ව්‍යාපාරයේ ගොඩනැගිලෙන් කොටසක් මසකට රු.15000 ක මුදලකට 2017.07.01 දින කුලියට දෙන ලදී. 2017.12.31 දින වන විට ගොඩනැගිලි කුලී ආදායම් ලෙස රු.75000 ක මුදලක් ව්‍යාපාරයට ලැබී ඇත.

අවශ්‍ය වන්නේ :

(අ) 2017.12.31 දිනට ශේෂ පිරික්සුමේ දැක්වෙන ගෙවල් කුලී ආදායම් ප්‍රමාණය දැක්වීම.

(ආ) උපචිත ගොඩනැගිලි කුලී ආදායම් අයත් වන ගිණුම් වර්ගය ලියා දැක්වීම.

(ඉ) 2017 වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්විය යුතු ගොඩනැගිලි කුලී ආදායම දැක්වීම.

(ඊ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු උපචිත ගොඩනැගිලි කුලී ආදායම දැක්වීම.

(ලකුණු 02)

III. ජයසූරියගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
විකුණුම්		428000
2017.01.01 දිනට තොගය	16000	
ගැනුම්	210000	
ගෙන ඒමේ කුලිය	8000	
ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැයට	400000	
ලීබඩු හා උපකරණ - පිරිවැයට	60000	
2017.01.01 දිනට ලී බඩු හා උපකරණ ක්ෂය වෙන් කිරීම		12000
ණය ගැතියෝ	26000	
ණය හිමියෝ		33000
දුන් වවට්ටම්	3000	
ලද වට්ටම්		7000
බොල් ණය	4000	
ගැනිලි	9000	
12% බැංකු ණය (2017.12.01 දින ලබා ගත්)		100000
විදුලි ගාස්තු	22000	
වෙළෙඳ සේවක වේතන	54000	
වරිපනම් ගාස්තු	2000	
මුදල් ශේෂය	16000	
2017.01.01 දිනට ප්‍රාග්ධනය		250000
	830000	830000

අමතර තොරතුරු :

1. 2017.12.31 දිනට බඩු තොගය රු. 14000
2. ලී බඩු හා උපකරණ පිරිවැය මත 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
3. ණයගැතියන්ගෙන් තවත් රු.3000 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ :

(අ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)
(ආ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)
(මුළු ලකුණු 12)